මගේ අංකය : ED/02/09/සු.සැ.මේ. උසස් කිරීම/2025

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක 353, කෝට්ටේ පාර,
රාජගිරිය

2025.08. 18

සහකාර සුරාබදු කොමසාරිස්/ සුරාබදු අධිකාරී/ සුරාබදු ස්ථානාධිපතිවරුන් මගින්,
සියලුම සුරාබදු සැරයන්වරුන් වෙත

**<u>ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු මහ සැරයන් (සුරාබදු සැරයන් මේජර්) තනතුරට කුසලතා පදනම මත බඳවා ගැනීම - 2025</u>**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ, 2025.05.17 දිනට සුරාබදු මහ සැරයන් (සුරාබදු සැරයන් මේජර්) තනතුරු 32 ක පවතින පුරප්පාඩු අතරින් 90%ක පුරප්පාඩු (එනම් පුරප්පාඩු 29ක්), කුසලතා පදනම මත සම්පූර්ණ කිරීම සඳහා අමප/25/1174/802/004-VII හා 2025.07.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අනුමැතිය ලැබී ඇති අතර, ඒ සඳහා සුදුසුකම් ලබා ඇති සුරාබදු සැරයන්වරුන් අතරින්, සුරබදු සැරයන් තනතුරේ ජ්‍යෙෂ්ඨතාවය මත අනුපිළිවෙලින් පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. සපුරාලිය යුතු සුදුසුකම්**

i. සුරාබදු සැරයන්වරයෙකු ලෙස එම තනතුරේ ස්ථිර කර තිබීම.
ii. සුරාබදු සැරයන් තනතුරේ නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් වී තිබීම.
iii. සැරයන් තනතුරේ වසර පහ (05)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
iv. අනුමත කාර්ය සාධන ඇගැයීම් පරිපාටි අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05හි සතුටුදායක හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
v. පලාවන් 03 ලාංඡනය සම්පූර්ණ කර තිබීම.
vi. නියමිත දිනට පූර්වාසන්න වසර පහ (05)ක කාලය තුළ සියලුම වැටුප් වර්ධක නියමිත පරිදි උපයාගෙන තිබීම.
vii. නියමිත දිනට පූර්වාසන්න වසර 05 ක කාලය තුළ අසාධු සටහන්, වේතනාධික දඩුවම (වේතනාධිකය තාවකාලිකව අත්හිටුවීම දඬුවමක් නොවේ) හෝ ඊට වඩා බරපතල දඬුවම් නොලැබූ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**2. බඳවා ගැනීමේ ක්‍රමය :** මෙම බඳවා ගැනීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පමණක් පවත්වන අතර අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඉහත 1 යටතේ ඇති සියලුම සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්, ඔවුන් විසින් දැනට දරන සුරාබදු සැරයන් තනතුරේ ජ්‍යෙෂ්ඨතාවය මත අනුපිළිවෙළින් පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. එසේ වුවද, කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට තීරණය කළ හැකිය. <u>අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2025.08.29 වේ.</u>

**3. වැඩ බැලීමේ කාලය :** සුරාබදු මහ සැරයන් (සුරාබදු සැරයන් මේජර්) තනතුරට පත් කරනු ලබන නිලධාරීන් අවුරුද්දක වැඩ බලන කාලයකට යටත් කොට පත් කරනු ලැබේ. වැඩ බලන කාලපරිච්ඡේදයේ දී නව තනතුරට අදාලව පැවරී ඇති කටයුතු, රාජකාරී හා වගකීම් නොපිරිහෙලා ඉටු කරමින් හා කාර්යක්ෂම ලෙස සේවය කරමින් ද වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වන්නේ නම් ද, වැඩ බැලීමේ කාලය අවසානයේ දී පත්වීම ස්ථිර කරනු ලැබේ.

2 පිටුවට

**4. කාර්යක්ෂමතා කඩඉම :** සුරාබදු මහ සැරයන් (සුරාබදු සැරයන් මේජර්) තනතුරට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර සුරාබදු මහ සැරයන් තනතුරට අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ 08 හි 8.1 අනුව හා ඇමුණුම 03 අනුව සුරාබදු මහ සැරයන් තනතුරේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

**5. වැටුප් පරිමාණය :** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව සුරාබදු මහ සැරයන් (සුරාබදු සැරයන් මේජර්) තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය රු. 55,410-670x7-890x2-1,190x25-රු.91,630/- (RS 3-2025) ක් වේ.

**6. අයදුම් කිරීමේ ක්‍රමය :** ඉහත අංක 1 හි සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් වේ නම්, මෙහි ඇමුණුම 1 යටතේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව තමන් විසින් සකසාගත් අයදුම්පතක් නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කර සුරාබදු ස්ථානාධිපති/සුරාබදු අධිකාරී/සහකාර සුරාබදු කොමසාරිස් මඟින් එම අයගේ නිර්දේශ ද සහිතව 2025.08.29 දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් මා වෙත එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලැබෙන අයදුම්පත් අනුව අයදුම්කරුවන්ගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කිරීමෙන් අනතුරුව පවත්වනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් පසුව මෙම සුරාබදු මහ සැරයන් (සුරාබදු සැරයන් මේජර්) තනතුරට අදාල බඳවා ගැනීම සිදු කරනු ඇත.

ඒ අනුව, සුරාබදු මහ සැරයන් (සුරාබදු සැරයන් මේජර්) තනතුරේ පවතින සැලකිය යුතු පුරප්පාඩු ප්‍රමාණය නිසා එම තනතුරට අදාල බඳවා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කිරීම සඳහා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම නුදුරේ දීම සිදුකිරීමට නියමිත බැවින්, ඔබගේ පෞද්ගලික ලිපිගොනුවේ අඩුපාඩු වේ නම්, එම අඩුපාඩු ඉතා ඉක්මනින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරගන්නා ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එම්.බී.එන්.ඒ. ජේමරත්න
සුරාබදු කොමසාරිස් ජනරාල්

එම්.බී.එස්.ඒ.ජේමරත්න
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

ඇමුණුම 1

**සුරාබදු මහ සැරයන් (සුරාබදු සැරයන් මේජර්) තනතුරට කුසලතා පදනම මත බඳවා ගැනීම - 2025**

**ආදර්ශ අයදුම්පත්‍රය**

1. නිලධාරියාගේ නම : ..............................
2. තනතුර හා සේවා අංකය : ..............................
3. සේවය කරන ස්ථානය : ..............................
4. දැනට දරන තනතුර හා ඊට පත්කළ දිනය : ..............................
5. දැනට දරන තනතුරේ ස්ථිර කර තිබේ ද? : ..............................
6. සුරාබදු සැරයන් තනතුරට අදාල කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය : ..............................
7. ජාතික හැඳුනුම්පත් අංකය : ..............................
8. උපන් දිනය : ..............................
9. ස්ථිර සේවා කාලය : ..............................
10. පසුගිය වසර පහ (05) තුළ වේතනාධික සියල්ල උපයාගෙන තිබේ ද (ඔව්/ නැත) ? : ..............................
11. ඉහත 10 ට "නැත" නම් ඊට හේතු දක්වන්න.

    ..............................

    ..............................

12. යහපත් කල් ක්‍රියාව සඳහා වූ පලාවන් තුන ලාංඡනය ලබා තිබේ ද (ඔව්/ නැත)?..............................
13. පසුගිය වසර පහ (05) තුළ දී කිසියම් දඬුවමක් හෝ වැටුප් වර්ධක දඬුවමක් ලබා තිබේ ද (ඔව්/ නැත) ?

    ..............................

14. පසුගිය වසර පහ (05) තුළදී කිසියම් දෝෂාරෝපණයකට නොවැඩි දඬුවමක් හෝ අසාධු සටහනක් ලබා තිබේ ද (ඔව්/ නැත) ? : ..............................
15. ඉහත 13 හා/හෝ 14 ට "ඔව්" නම් විස්තර සපයන්න.

    ..............................

    ..............................

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය බව හෝ වැරදි බව, තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුර සඳහා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, නව තනතුරට පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මා දනිමි.

දිනය : ..............................

..............................
අයදුම්කරුගේ අත්සන